052906
2015/07/21
MLIPR
D - 822

# ශ්‍රී ලාංකේය නර්තනයේ භාවිත හැඩතල පිළිබඳ අධ්‍යයනයක්

(උඩරට නර්තන සම්ප්‍රදාය - මූලික අභ්‍යාස විධි)

**DD/MP/DA/08/036**

ඩී. ඩබ්ලිව්. අසේල රංගදේව

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයීය නර්තන හා නාට්‍ය කලා පීඨයේ
ප්‍රාසංගික කලාපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2013

# හැඳින්වීම

ශ්‍රී ලාංකේය නර්තන කලාව සාම්ප්‍රදායික නර්තනයේ සිට නව නිර්මාණාත්මක නර්තනය දක්වා සංවර්ධනය වීමේ දී ගුණාත්මක ඵලඹීම් රාශියක් ලබා ගෙන ඇත.

i. ප්‍රාථමික අභිචාර විධියේ සිට විධිමත් ශාන්තිකර්ම නර්තනය තෙක් පැමිණීම
ii. පාරම්පරික ගුරුකුල අධ්‍යාපනයට පිවිසීම
iii. ජාතික අධ්‍යාපන ක්ෂේත්‍රයට පිවිසීම
iv. උසස් අධ්‍යාපනයට පිවිසීම
v. ප්‍රාසාංගික කලාව අතික්‍රමණය කිරීම, ලබා ගත් කැපී පෙනෙන කඩයිම් වේ.

මෙම සීමාවන් ජය ගැනීමේ දී න්‍යායික හා ප්‍රායෝගික දැනුම සම්පාදනය කිරීම එකල නර්තන කලාවට මහත් කැපවීමක් ඉටු කළ සියලු නර්තනකලා විදිවතුන්ට පැවරුණු වගකීම විය. පාරම්පරික ඇදුරන්ගේ සිට පාඨශාලීය හා විශ්වවිද්‍යාල නර්තන ආචාර්යවරුන්ට ද, සංස්කෘතික අධ්‍යයනයන්වල නියුතු විද්වතුන් ද එම නව දැනුම සම්පාදනය සඳහා විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ සිය පර්යේෂණාක්ෂය යොමු කළ හ. නර්තන කලාව පිළිබඳ යාවජීව අධ්‍යයනයන්ට ප්‍රවිෂ්ට වූවන් වැඩිදෙනෙකු භාරතීය කලා අධ්‍යාපනයට යොමු වුණු අතර, ඉතාමත් සුළු පිරිසක් බටහිර රටවල අධ්‍යාපනය සඳහා යොමු විය.

ඔවුන්ගේ එම උත්සාහයන් නර්තන පිළිබඳ සාහිත්‍ය පසුබිම ගවේෂණය, ශාන්තිකර්ම හා සමාජය අතර සබඳතාව අධ්‍යයනය, ජනශ්‍රැති අධ්‍යයනය හා වෙනත් සංස්කෘතීන්ගේ ආභාෂය පිළිබඳ අධ්‍යයනයන් වැනි ක්ෂේත්‍ර කරා පැතිරී තිබුණි. ඉහත සඳහන් එක් එක් ක්ෂේත්‍රයන් තුළින් පුළුල් අධ්‍යයන සිදු වුවත්, නර්තන කලාවේ මූල ධර්ම හා තාක්ෂණික වර්ධනය උදෙසා සිදු වූ දායකත්වය පිළිබඳ සෑහීමකට පත් විය නොහැකිය. භාරතීය සහ බෙන්ගාලී කලා පුනරුදය ලාංකවේ නර්තන කලාව කෙරෙහි බලපෑවේ තරමක පූර්ණ අනුකරණවාදී හෝ රොමැන්තික අනුකරණවාදී සිද්ධාන්ත ක්ෂේත්‍ර ගත කරීම සඳහා ය. එයින් උන්මාදයට පත් ලාංකේය නර්තන කලාකරුවන් පදනම් විරහිත නව නර්තන ප්‍රවණතා පසුගිය සියවස පුරා කළ එළි දැක්වූහ. එම ප්‍රයත්නයන් හේතුවෙන් නර්තන කලාව වෙනත් අයුරකින් පොදු ජනප්‍රසාදය ට ලක් වූව ද ඒ පසු පස විවිධ දෝෂාරෝපණයන් එල්ල වන්නට විය. ඒ අතුරින් ශාස්ත්‍රීය නර්තන හා ජනප්‍රිය නර්තන රැල්ල අතර පවතින,

i. නීරස බව
ii. උස් පහත් බව
iii. නිර්මාණාත්මක බව හා නොමැති බව
iv. තාක්ෂණික බව හෝ තාක්ෂණික දුර්වල බව
v. ප්‍රාසංගික බව
vi. ප්‍රාසංගික දුර්වල බව

ආදී මාතෘකා රැසක් ජන කරලියට විචාරවත් හා අවිචාරවත් දෘෂ්ටි කෝණයෙන් පැමිණියහ.

මෙම සමස්ත අදහස් සම්පිණ්ඩ කළ විට සාම්ප්‍රදායික නර්තනය හා සමගාමීව සංවර්ධනය නොවූ පැතිකඩක් පිළිබඳ වැඩි අදහසක් ප්‍රකට වෙයි. එනම්, නර්තන හැඩතල හා චලන වේදයන් පිළිබඳ ප්‍රායෝගික හා න්‍යායාත්මක පර්යේෂණන් ක්‍රියාත්මක නොමැති වීමයි. එකී කාරණා පිළිබඳ සවිඥාණික විමර්ශනශීලී දෘෂ්ටියක් හෙළීම සහ "ශ්‍රී ලාංකේය නර්තනයේ භාවිත හැඩතල පිළිබඳ අධ්‍යයනයක්" මැයෙන් අප මෙම පර්යේෂණයට පිවිසෙන ලදී.

එහි දී විශ්ව නර්තන කලාවේ නවතම පර්යේෂණ ක්ෂේත්‍රයන් වන,

i. නර්තන දේහ ව්‍යුහ විද්‍යාව (Dance Anatomy)
ii. නර්තන (දේහ) චාලක විද්‍යාව (Dance Kinesiology)
iii. නර්තන ඉරියව් විශ්ලේෂණය (Dance Movement Analysis)

ආදී ප්‍රමුඛ ක්ෂේත්‍ර 03 ක් හමුවේ. එම ක්ෂේත්‍ර ඇසුරු කරගනිමින් පර්යේෂණයට අවතීර්ණ වීමට අප යොමු කළේ එහි තුළ විද්‍යමාන වූ වඩාත් විද්‍යාත්මක අධ්‍යයනයන් හේතුවෙනි. එමෙන්ම එම සොයා ගැනීම් විශ්වයේ කුමන නර්තන සම්ප්‍රදායකට වූ පොදු බවක් පැවතීම අපගේ අධ්‍යයනය වඩාත් පහසුකරන්නට විය.

අපගේ පළමු වැනි පරිච්ඡේද අවධානය යොමු කරන්නේ නර්තන චලන හා හැඩතල පිළිබඳව පවතින විවිධ නිර්වචන විශ්ලේෂණය කිරීම සඳහා වන අතර එහි දී මානව චලන විශ්ලේෂණය පිළිබඳ පසුබිම සාකච්ඡා කිරීමට අපේක්ෂා කරන ලදී. මෙහි දී නර්තන චලන හා ඉරියව් සම්බන්ධ පෙර අපරදිග වාග්මාලාවක් හඳුනා ගැනීමට ද හැකි විය.

දෙවැනි හා තෙවැනි පරිච්ඡේදවල පිළිවෙලින් පා සරඹ හා ගොඩ සරඹ පිළිබඳ විශ්ලේෂණයන් විවිධ දෘෂ්ටි කෝෂණයන් ඔස්සේ ගෙන හැර දැක්වීම හැකි විය. අපගේ හතරවැනි පරිච්ඡේදය තුළින් නර්තන කලාව පිළිබඳ භෞතික විද්‍යාත්මක

විමර්ශනයක් ඉදිරිපත් කිරීමට සමත් විණි. විශේෂයෙන් නර්තනය හා ජ්‍යාමිතිය පිළිබඳ දේශීය නර්තන කලාව තුළ විද්‍යමාන කරුණු රැසක් ඉදිරිපත් කිරීමට හැකි විණි.

අභ්‍යාස විද්‍යාත්මක විශ්ලේෂණය නර්තන චලන සංරක්ෂණය හා සංචරනය යන මාතෘකාව ඇසුරින් උඩරට නර්තන කලා සම්ප්‍රදායේ පා සරඹ හා ගොඩ සරඹ තුළ ඇති අභ්‍යාස විද්‍යාත්මක පසුබිම හා නර්තන හැඩතල සංරචනය හා සංරක්ෂණය පිළිබඳ කරුණු රැසක් පස් වන පරිච්ඡේදයෙන් ආවරණය කර ගැනීමට හා ඉදිරිපත් කිරීමට හැකි විණි.

මෙම පර්යේෂණ නිබන්ධය සම්පාදනය කිරීමේ දී ඇති වූ ප්‍රබලම ගැටළුව වනුයේ වචන භාවිතයෙන් නර්තන ඉරියව් විශ්ලේෂණය කිරීමයි. නමුත් නිබන්ධ උපදේශක වරයා සමඟ සිදුවූ එකඟ තාවෙන් අනතුරු ඇතැම් නර්තන චලන විග්‍රහයන් ට අත්‍යාවශ්‍ය රූප පමණක් නිබන්ධයේ අන්තර් ඡේදවල දී භාවිත කරන ලදී.

සම්මතයක් වශයෙන් ගත් කළ මෙම නිබන්ධනය උඩරට නර්තන කලාවේ පා සරඹ හා ගොඩ සරඹ පිළිබඳ මෙතෙක් කිසිවෙකුත් ප්‍රවිශ්ට නොවූ නවතම දෘෂ්ටි කෝණයන් හා තාක්ෂණික ක්‍රම වේදයක් ඔස්සේ සිදු කළ නර්තන චලන හා හැඩතල පිළිබඳ තුලනාත්මක හා විමර්ශනාත්මක අධ්‍යයනයකි.